විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு
UNIVERSITY GRANTS COMMISSION

මගේ අංකය / எனது இலக்கம் / My Number } UGC/HR/10/01

තැපැල් පෙට්ටිය / அஞ்சல் பெட்டி / Post Office Box } 1406

ඔබේ අංකය / உமது இலக்கம் / Your Number }

20, වෝඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකාව.
20, வாட்டு இடம், கொழும்பு 7, இலங்கை.
20, Ward Place, Colombo 07, Sri Lanka.

15.12.2025

Vice-Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutions

**Issuing of Motor Vehicles Permits on Concessional Terms under Trade and Investment Policy Circular No. 01/2018, 01/2018 (I)**

This is with reference to the letter No. DMS/1528(Vehicle Permit)V-I dated 22.08.2025 sent by the Director General, Department of Management Services to the Secretary, Ministry of Education, Higher Education and Vocational Education with a copy to me on the above matter (**Annex I**).

As mentioned in the above letter, it has been informed that after a new Faculty/Department is established by a Gazette notification for Universities or Higher Educational Institutions, it is mandatory to obtain formal approval from the Department of Management Services for the staff required for that Faculty or Department.

It has also been informed that it is also mandatory to obtain the approval of the Department of Management Services in the event of a permanent transfer of the posts of the approved staff of a Faculty/Department to a new Faculty/Department and in the event of a change in the name of an approved Faculty/Department.

Furthermore, as stated in the above paragraphs, if there are Faculties/Departments or staff in Universities or Higher Educational Institutions that have not been formally approved by the Department of Management Services, please make arrangements to submit them to the Department of Management Services for approval without further delay.

**Senior Prof. Kapila Seneviratne**
Chairman

Cc: Secretary, Ministry of Education, Higher Education and Vocational Education

Annex I

RECEIVED
437
23 SEP 2025

415
22 SEP 2025
UNIVERSITY GRANTS COMMISSION
CHAIRMAN

23-09-2025

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
(උසස් අධ්‍යාපන අංශය)
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
(உயர் கல்விப் பிரிவு)
MINISTRY OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION
(HIGHER EDUCATION DIVISION)

© +9411-2697721/+9411-2691378
+9411-2674768
info@mohe.gov.lk www.mohe.gov.lk

18, වෝඩ් පෙදෙස, කොළඹ 07.
18, வோட் பிளேஸ், கொழும்பு 07.
18, Ward Place, Colombo 07

| මගේ අංකය / எனது இல. / My No. | HEAD/VP/GE | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2025.09. 19 |
|---|---|---|---|---|---|

සභාපති,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක. 01/2018, 01/2018 (I) අනුව සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබටද පිටපතක් සහිතව අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් එවන ලද අංක DMS/1528/(Vehicle Permit) V-I හා 2025.08.22 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක. 01/2018, 01/2018 (I) අනුව සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමේදී අදාළ නිලධාරියා සේවය කරනු ලබන පීඨය හෝ දෙපාර්තමේන්තුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි අනුමත කර ගැනීම අත්‍යවශ්‍ය බව අවධාරණය කර ඇති අතර එසේම විධිමත් පරිදි අනුමත කර නොගත් පීඨ/දෙපාර්තමේන්තු පවතී නම් නොපමාව අදාළ අනුමැතිය සඳහා යොමු කරන ලෙස වැඩිදුරටත් සඳහන් කර ඇත.

03. එහෙයින් මේ සම්බන්ධයෙන් ඔබගේ කාරුණික අවධානය යොමු කර ඔබ යටතේ පවතින සියලුම විශ්වවිද්‍යාල සහ ඊට අනුබද්ධිත ආයතන මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර ඔබගේ පහසුව පිණිස අදාල ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.

අනෝජා පී. ගුරුගේ
අතිරේක ලේකම් (පාලන හා මුදල්)
ලේකම් වෙනුවට

දුරකථන අංකය : +94 112- 688 338
ෆැක්ස් අංකය : +94 112- 688 338
විද්‍යුත් තැපැල : addsec-admin@mohe.gov.lk

අමාත්‍ය කාර්යාලය / அமைச்சர் அலுவலகம் / Minister Office
+94112685268
+94112682612
minister@mohe.gov.lk

ලේකම් කාර්යාලය / செயலாளர் அலுவலகம் / Secretary Office
+94112671355
+94112674770
secretary@mohe.gov.lk

# කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
முகாமைத்துவ சேவைகள் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT SERVICES

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහා භාණ්ඩාගාරය, කොළඹ 01. | பொது திறைசேரி, கொழும்பு 01. | General Treasury, Colombo 01.



SAS 02 SEP 2025


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date |
|---|---|---|
| DMS/1528(Vehicle Permit)V-I | HE/AD/VP/Gen (x) | 2025.08. 22 |

ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම්තුමනි,

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018, 01/2018(I) අනුව සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ ඔබේ සමාංක හා 2025.07.28 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018, 01/2018(I) අනුව සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමේ දී අදාළ නිලධාරියා සේවය කරනු ලබන පීඨය හෝ දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්ය මණ්ඩලය අනුමත කර තිබීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් කරුණු විමසා ඇත.

03. යම් විශ්වවිද්‍යාලයක් හෝ උසස් අධ්‍යාපන ආයතනයක් සඳහා ගැසට්පත්‍රයක් මගින් නව අධ්‍යයන පීඨයක් / දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කළ පසු එම පීඨය හෝ දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් විධිමත් පරිදි අනුමත කර ගැනීම අනිවාර්ය වේ.

04. එමෙන්ම යම් අධ්‍යයන පීඨයක / දෙපාර්තමේන්තුවක අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු නව අධ්‍යයන පීඨයක් / දෙපාර්තමේන්තුවක් වෙත ස්ථිරවම හුවමාරු කිරීමක දී හා අනුමත අධ්‍යයන පීඨයක / දෙපාර්තමේන්තුවක නාමය සංශෝධනය කිරීමේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම ද අත්‍යවශ්‍යය වන බවද කාරුණිකව දන්වා සිටිමි.

05. තවද, ඉහත 03 හා 04 ඡේදයන්හි දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතන තුල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි අනුමත කර නොගත් පීඨ / දෙපාර්තමේන්තු හෝ කාර්ය මණ්ඩලය පවතී නම් නොපමාව අනුමැතිය සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන මෙන් කාරුණිකව වැඩිදුරටත් දන්වා සිටිමි.

මෙයට විශ්වාසී,

විමල් එස්.කේ. ලියනගම
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - සියළු විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන දැනුවත් කිරීම සඳහා


කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484757, 011 - 2484640 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2430270, 011- 2484846 | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: dgms@msd.treasury.gov.lk | වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk